# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,142 - 2019 සැප්තැම්බර් මස 20 වැනි සිකුරාදා - 2019.09.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2758 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2760 |



*සැ. යු.*-(i) ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2019 සැප්තැම්බර් මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ඔක්තෝබර් මස 11 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 සැප්තැම්බර් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

---

2755 - B 81561— 5,403 (2019/09)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස්

1976 අංක 19න් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ විධිවිධානයන්ට සහ වරින්වර පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සියලු විභාග අපේක්ෂකයින් බැඳී ඇත.

1976 අංක 19 සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 20 වගන්තිය මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත කොන්දේසි හා සීමා කිරීම් නියම කරනු ලැබේ.

සියලු විභාග අපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු අතර මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි පහත දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකි ය.

(i) විමර්ශනයට භාජනය වූ මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම
(ii) විමර්ශනයට භාජනය වූ විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම
(iii) මුළු ජීවිත කාලයටම විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(iv) නිශ්චිත කාලවකවානුවක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(v) අත්හිටවූ විභාග තහනමක් සහිතව ලිපියක් නිකුත් කිරීම
(vi) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම
(vii) ප්‍රසිද්ධ විභාග පනත යටතේ අපරාධ නඩුවක් පැවරීම සඳහා විභාග අපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ එම ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම
(viii) විභාග අපේක්ෂකයා රජයේ සේවකයකු වන අවස්ථාවකදී විභාග අපේක්ෂකයාගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අදාළ විභාග අපේක්ෂකයාගේ පත්වීම් බලධාරියා වෙත (විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා) වාර්තා කිරීම

විභාගයට පෙර හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ මොනයම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

1. සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ විභාග පරිශ්‍රය තුළදී විභාග ශාලාධිපතිට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද අනෙකුත් විභාග අපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස හැසිරිය යුතුය. එසේම, විභාග අපේක්ෂකයන් විභාග පරිශ්‍රයේ දේපළවලට හෝ විභාග කාර්ය මණ්ඩලයේ පෞද්ගලික දේපලවලට කිසිදු අන්දමකින් හෝ අලාභ හානි නොකළ යුතු ය.

2. විභාග අපේක්ෂකයින් විභාගය පවත්වාගෙන යන කාලසීමාව තුළදීත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතිගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම ආරම්භ කර පැය භාගයක් ගත වූවාට පසු කිසිදු විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නොලැබේ. විභාගය අවසන් වන තුරු ද කිසිම අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටව යාමට ඉඩ ලබා දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට නියමිත වේලාවට සහභාගී වීමට කටයුතු කළ යුතු ය.

4. සෑම විභාග අපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම කරන ලද අසුන හැර වෙනත් තැනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදු වේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතා බහ කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් වේ.

6. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ අපේක්ෂකයාගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම, උත්තර පත්‍රය හඳුනාගත හැකි වන අයුරින් යම් සලකුණක් හෝ සටහනක් යෙදීම, උත්තර පත්‍රවල අසභ්‍ය හෝ අනවශ්‍ය දේ ලිවීම, උත්තර පත්‍ර සමග මුදල් නෝට්ටු ඇමිණීම සපුරා තහනම් වේ. අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය තම උත්තර පත්‍රයේ ලිවීම ද වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ද ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත.

7. තමන් වෙත විභාග ශාලාවේදී සපයන කඩදාසි (විභාගය පැවැත්වෙන දිනයට අදාළව නිරීක්ෂකගේ කෙටි අත්සන හා දිනය යොදා ඇති පිළිතුරු ලිවීමේ කඩදාසි) හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනත් තැනක හෝ කිසිවක් නොලිවිය යුතු ය. මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. විභාග අපේක්ෂකයින් වෙත සපයනු ලබන කඩදාසි හෝ පිළිතුරු ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම පැහැදිලිව කපා හැර උත්තර පත්‍රයට ඇමිණීම හෝ විභාගය අවසානයේ පිළිතුරු පත්‍ර සමග භාරදීම හෝ ලබා දෙන උපදෙස් පරිදි සිදු කළ යුතුය. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයාම තහනම් වේ. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක නැවත ලියවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය.

9. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම් ය. මෙම සියලු ද්‍රව්‍යයන් විභාග කොමසාරිස් ජනරාල් සතුවන අතර මෙම නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා එක් එක් විභාගයේදී ළඟ තබා ගැනීමට ලිඛිතව අවසරදී ඇති ද්‍රව්‍යයන් හැර වෙනත් සටහන් පොත්, සටහන් ඇතුළත් කොළ හෝ කොළ කැබලි යනාදිය විභාග ශාලාව තුළ විභාගයට පෙනී සිටින අවස්ථාවේදී තමා සන්තකයේ හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතු ය. එසේම විභාග ශාලාව තුළ දී ජංගම දුරකථන, විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) තමා සන්තකයේ හෝ සමීපයෙහි තබා ගැනීම සහ එම උපකරණ / උපාංග භාවිතා කර බාහිර පාර්ශ්වයන්ගේ උදව් ලබා ගැනීම හා විභාගය පැවැත්වෙන අතරතුර වෙනත් පාර්ශ්ව හා සමාජ මාධ්‍ය වෙත තොරතුරු යැවීම වංචනික ක්‍රියාවක් සේම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

11. විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග ඉහත 10 ඡේදයේ විස්තර කර ඇති කාර්යයන් සඳහා භාවිතා කර අසු වුවහොත් එම උපකරණ / උපාංග අදාළ විමර්ශන කටයුතු අවසන් වන තුරු විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී කිසිම විභාග අපේක්ෂකයකු ළඟ, විභාගය සඳහා ගෙන ඒමට අවසර ලබාදී නොමැති කිසිදු ද්‍රව්‍යයක් හෝ උපකරණයක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාග ශාලාධිපති හෝ කාර්ය මණ්ඩලය නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තම සන්තකයේ තිබෙන දෑ සහතික කිරීමට සහ පරීක්ෂා කිරීමකට යටත් වන අතර මෙම අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට උත්සහ දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. යම් අපේක්ෂකයකු වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ සංඥා මගින් හෝ වෙන කිසිවකින් හෝ කොපි කිරීම හෝ කොපි කිරීමට ප්‍රයත්න දැරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම හෝ වරදක් වන්නේ ය. වෙන අයදුම්කරුවකුට උදව් දීම ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ විභාග කාර්ය මණ්ඩලයෙන් හෝ උදව් ලබා ගැනීම ද වරදක් වන අතර උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යටින් තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

14. විභාගය ආරම්භ වී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් වැසිකිළි/කැසිකිළි යාමට අවශ්‍යතාවයක් උදෙසා විභාග අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටතට යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ අපේක්ෂකයාට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එලෙස පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු/ඇය සෝදිසියකට භාජනය විය යුතු ය.

15. විභාග ශාලාවේ පිළිතුරු ලිවීමට පටන් ගැනීමට පෙර හෝ පසුව නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් වන්නේය. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

16.විභාග අපේක්ෂකයකු හෝ විභාග අපේක්ෂකයකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

17. විභාග අපේක්ෂකයන් පහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය. ඃ

(i) සෑම විභාග අපේක්ෂකයෙකුම තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කර ගැනීමත්, ඉල්ලුම් කරන ලද විෂයයන් හා ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන් අතර නොගැලපීමක් පවතින්නේ නම් විභාග දෙපාර්තමේන්තුව විමසා විභාගයට පෙර සංශෝධනය කර ගැනීමත් සිදු කළ යුතු ය.

(ii) විභාගය පටන් ගැනීමට පැය බාගයකට (1/2) පෙර විභාග ශාලාව වෙත පැමිණීම සුදුසු වන අතර විභාග ශාලාව නිශ්චිතව නොදන්නා විට විභාගය පටන් ගන්නා දිනට කලින් ඒ පිළිබඳ සොයා බලා නියම ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කර තම අනන්‍යතාව තහවුරු කළයුතු ය.

(අ). අනන්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරන අතර, යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ පිළිබඳ විභාග ශාලාධිපති දැනුවත් කර විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීම කටයුතු කළයුතු ය.

(ආ). සෑම අපේක්ෂකයකුම තම අනන්‍යතාව පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකිවන අයුරින් විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.

(iv) විභාග අපේක්ෂකයන් බ්ලූටූත් වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී තම දෙකන විවෘතව පැහැදිලිව පෙනෙන ලෙස තබාගත යුතු ය.

(v) විභාග ශාලාවේදී ඔබට ලබා දෙනු ලබන කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුය. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ මේසය මත තබා යා යුතු ය.

(vi) විභාග අපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතු ය.

(vii) තමන් භාවිතා කරන පිළිතුරු ලිවීමේ පොත සහ සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද, පිරිසිදුව ද උත්තර ලිවිය යුතු ය. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු එම ප්‍රශ්නයේ ම අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක් රූලක්වත් හිස්ව තිබිය යුතුය. සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

(viii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුය. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක නිවැරදිව යෙදීමට කටයුතු කළ යුතු ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද, සෑහෙන පමණ විශාලව ද තිබිය යුතු ය.

(x) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කර ඇති උපදෙස් හොඳින් කියවා බැලිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු ලබාදී නොමැති අවස්ථාවලදී ලකුණු ලබා දීම සිදු කරනු නොලැබේ.

(xi) එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද පොතට අමතරව ලියන කඩදාසි පිටු අංක පිළිවෙළ අනුව එකතුකර වම් පැත්තේ ඉහළ කෙළවරේ නොගැලවෙන සේ ගැටගැසීම / ඇමිණීම කළයුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර සියලුම පිළිතුරු ලියූ කොළ අමුණා තිබේද යන්න තහවුරු කරගත යුතුය. පිළිතුරු පත්‍ර භාරදුන් පසුව විභාග මධ්‍යස්ථානයෙන් බැහැරට ගෙන ගිය කිසිදු පිළිතුරු ලියූ කඩදාසියක් ඇගයීමට ලක් කරනු නොලැබේ.

(xii) ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිලධාරියකුට භාරදිය යුතුය. උත්තර පත්‍ර එකතු කරන තුරු ඔබගේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම්විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය.

(xiii) යම් කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට කථා කිරීමට අවශ්‍ය වූ විට අන් අයට බාධාවක් නොවන සේ දෙවරක් මේසයට තට්ටු කිරීමෙන් සංඥා කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අනුරාධපුරය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතුය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05.අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 ඔක්තෝබර් මස 21 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 අගෝස්තු මස 29 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

## උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අනුරාධපුරය | පලාගල | කලාගම් පළාත කොට්ඨාසයේ බළලුවැව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය. |

09-626

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධූරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 ඔක්තෝබර් මස 21 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 අගෝස්තු මස 29 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | තුම්පනේ | මැදසිය පත්තුව කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා තුම්පනේ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |
| මහනුවර | පූජාපිටිය | ගලසිය පත්තුව 01 කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා හාරිස්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |

09-644

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සහ ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය සංශෝධනය කිරීම — බදුල්ල දිස්ත්‍රික්කය

*ගැසට්* අංක 2136 හා 2019.08.09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ නිවේදනය කර තිබූ පහත උපලේඛනයේ සඳහන් තනතුරට අදාළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019.10.21 දින දක්වා දීර්ඝ කෙරෙන අතර අයදුම්පත් කැඳවන කොට්ඨාසය හපුතලේ කොට්ඨාසයේ බණ්ඩාරවෙල නගරයේ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය හා කොට්ඨාසය පමණක් නිවැරදි විය යුතු අතර එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බවද කරුණාවෙන් සලකන්න.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | බණ්ඩාරවෙල | හපුතලේ කොට්ඨාසයේ බණ්ඩාරවෙල නගරයේ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල. |

09-645

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

### ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

### කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව

*පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා ආධුනිකයින් බඳවා ගැනීම - 2020 ජනවාරි*

ශ්‍රී ලංකා ජර්මන් ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන මොරටුව කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයෙහි (IETI) පහත සඳහන් පාඨමාලා හැදෑරීම සඳහා තරුණ තරුණියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. පවත්වනු ලබන පාඨමාලා ඃ

| | *පාඨමාලා විස්තර* | *ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)* | *කාලය* |
|---|---|---|---|
| 01, 02, 03 වෘත්තීන් සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් සමග අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ගණිතය සහ විද්‍යාව සමඟ විෂයයන් 6ක් සමත් වී තිබීම හෝ අ.පො.ස. (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය හෝ තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන් 2න් එක් විෂයයකට සාමාර්ථයක් ලබා තිබීම හා අ.පො.ස. (සා.පෙළ) සිංහල භාෂාව, විද්‍යාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 6 ක් සමත් වී තිබීම. | | | |
| 01. | **ඉලෙක්ට්‍රොනික් කාර්මික ශිල්පී (විශේෂ)**<br>(Basic Work Shop practice, Domestic Electrical Installation , Analog & Digital Electronic, Industrial Electronic, PLC, Micro Controller, " PIC ", ARDUINO & Project Works) | - | අවු. 03 |

| | පාඨමාලා විස්තර | ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) | කාලය |
|---|---|---|---|
| 02. | **විදුලි කාර්මික ශිල්පී (විශේෂ)**<br>ගෘහස්ත හා කර්මාන්ශාලා විදුලි පරිපථ, විදුලි මිනුම් උපකරණ, ගෘහස්ථ/කර්මාන්තශාලා ආරක්ෂක හා සන්නිවේදන පද්ධති වායු පාලන තාක්ෂණය, PLC තාක්ෂණය, ඩිජිටල් ඉලෙක්ට්‍රොනික්ස්, ඔටෝමේෂන් පද්ධති | 4 වන මට්ටම | අවු. 03 |
| 03. | **ඉදිකිරීම් සුපරීක්ෂක**<br>(Construction Management, Surveying & Leveling, Road Construction, Auto Cad, Quantity Surveying, Building Drawing & Estimate) ක්ෂේත්‍රයේ දැවැන්ත සමාගම් සමග වැඩබිම් පුහුණුව | 4 වන මට්ටම | අවු. 01 1/2 |
| 04, 05 වෘත්තීන් සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ගණිතය ඇතුළුව විෂයන් 6 කින් සමත් වීම. | | | |
| 04. | **ශීතකරණ හා වායු සැකසුම් කාර්මික ශිල්පී**<br>සියලුම වර්ගයේ ශීතකරණ, ගෘහස්ත හා කර්මාන්තශාලා වායු සමන පද්ධති | 4 වන මට්ටම | අවු.02 |
| 05. | යන්ත්‍ර කාර්මික ශිල්පී (විශේෂ) - Machinist (Special)<br>CNC Programming, CNC Machining, EDM Process, Wire Cutting Process, Laser Cutting, Solid Works, Auto Cad | 4 වන මට්ටම | අවු.03 |
| 06, 07 වෘත්තීන් සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් සමත්වීම සහ මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම. | | | |
| 06. | **තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පී** -(ICTT)<br>(Maintain files & folders, Ms Word, Ms Excel, Ms Power Point , Maintain Database(Ms Access), Internet & E-mail, Install & Configure operating system, Installation & Troubleshooting of Network, Graphic for Web, Design static web pages, System Analysis & Design ) | 4 වන මට්ටම | අවු.01 |
| 07. | **පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පී**<br>(Adobe Photoshop, Adobe Illustrator, Adobe InDesign, Coral Draw, Printing & Scanning Method) | 4 වන මට්ටම | අවු.01 |
| 08, 09, 10, 11 වෘත්තීන් සඳහා අවම වශයෙන් අ.පො.ස.(සා.පෙළ) දක්වා අධ්‍යාපනය ලැබීම. | | | |
| 08. | පෑස්සුම් ශිල්පී (විශේෂ) - Welder (Special)<br>(MMA/ GAS/ TIG/ MIG/MAG/FCAW/PLASMA/ SPOT/ STUD Welding ශිල්පීය ක්‍රම, Destructive & Non Destructive Testing Methods, Plate & Pipe weld) | 4 වන මට්ටම | අවු.03 |
| 09. | **ජලනල කාර්මික ශිල්පී**<br>දැනට කර්මාන්ත ක්ෂේත්‍රයේ භාවිතා වන PVC, CPVC, GI, PB, PPR හා HDPE නල වර්ග But fusion, Heat fusion හා Electro fusion වැනි අති නවීන තාක්ෂණික ක්‍රමෝපාය භාවිතා කරමින් සම්බන්ධ කිරීම, නවීන සනීපාරක්ෂක උපාංග ස්ථාපනය, ජල පොම්ප ස්ථාපනය, උණුසුම් ජලනල පද්ධති ස්ථාපනය සහ සැලසුම් නිර්මාණය හඳුනාගැනීම සහ ඇස්තමේන්තු සකස් කිරීම. | 4 වන මට්ටම | අවු.02 |
| 10. | **දැව කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ)**<br>දැව සහ සංයුක්ත දැව භාවිතය, දැව මූට්ටු වර්ග, න්‍යායික දැනුම, සැලසුම් නිර්මාණය, ඇස්තමේන්තුව, නවීන යන්ත්‍ර ආරක්ෂිතව පරිහරණය, යන්ත්‍ර තල මුවහත් තැබීම හා නඩත්තුව, ගෘහ භාණ්ඩ නිෂ්පාදනය හා නිමහම් කිරීම, Auto Cad | 4 වන මට්ටම | අවු.02 |
| 11. | **පොත් බඳින්නා**<br>මුද්‍රණ කර්මාන්තය හඳුන්වා දීම, පොත් බැඳීම සහ අවසන් කිරීම, පොත් බැඳීමේ අවසාන කිරීමේ කොටස් හැඩගැස්වීම, මුද්‍රණයට සූදානම් වීම/ හිස් කඩදාසි සුරක්ෂිත කිරීම, Finishing කොළ සූදානම් කිරීම, එකතුකරගත් කොටස් සුරක්ෂිත කිරීම, පොත් කවරය සූදානම් කිරීම, Finishing කිරීම, Spring back පොත් බැඳීම, Rebinding කිරීම | 4 වන මට්ටම | අවු. 01 1/2 |

02. වයස : 2019.10.15 වැනි දිනට වයස අවුරුදු 16 ට නොඅඩු 35 ට නොවැඩි විය යුතුය.

03. පුහුණුව පිළිබඳ විස්තර :

3.1 සියලුම පාඨමාලා ද්විත්ව පුහුණු ක්‍රමය මත සැළසුම් කර ඇත. ඒ අනුව වෘත්තීය පුහුණුවේ පළමු භාගයේදී මූලික පුහුණුව ආයතනය තුළදී ලබාදේ. පුහුණුවේ දෙවන භාගයේදී වැඩිදුර පුහුණුව සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ. සියලුම වෘත්තීන් සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් අතිශයින් වැඩි වී ඇත.

04. තෝරා ගැනීමේ ක්‍රමය :
ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

05. අයදුම්පත් එවිය යුතු ආකාරය :

5.1 පහත දක්වා ඇති ආකෘතියට අනුව 11 1/2 x 8 1/4" (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරගත් හෝ www.naita.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත් ඉල්ලුම්පත් ඔබගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සමඟ 2019/10/15 දිනට පෙර අධ්‍යක්ෂ/විදුහල්පති, කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "ආධුනිකයින් බඳවා ගැනීම 2020 ජනවාරි" යන්න සඳහන් කළයුතු අතර, ඔබගේ ලිපිනය සඳහන් මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් ඔබගේ ඉල්ලුම්පත සමඟ එවිය යුතුය.

5.2 එක් අයදුම්කරුවෙකු තමන් කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් ඉල්ලුම්පතේ සඳහන් කළ යුතුය.

5.3 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ පූර්ණ කාලීන පාඨමාලාවක් දැනට හදාරණ අයට මේ සඳහා අයදුම් කළ නොහැක.

5.4 තැපෑලේදී නැතිවන හෝ ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය වගකියනු නොලැබේ. ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත කල් ඇතිව ඉදිරිපත් කළ යුතුය.

සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම්
අධිකාරිය
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත වැලිකඩ, රාජගිරිය.

ආදර්ශ අයදුම් පත්‍රය (" 11 1/2 x 8 1/4 " (A4) ප්‍රමාණයේ)

*ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය*

**කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව**

***ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත - 2020 ජනවාරි***

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————. මයා/මිය/මෙනෙවිය.

02. මුලකුරු සමග නම :————.

03. ලිපිනය :————.

04. පදිංචිය i. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
ii. දිස්ත්‍රික්කය :————.

05. දුරකථන අංකය :- නිවස :————. ජංගම :————.

06. උපන් දිනය :————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :————.

08. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම x ලකුණින් සළකුණු කරන්න)

| අ.පො.ස. (උ.පෙළ) | | අ.පො.ස. (සා.පෙළ) | | 8 වන ශ්‍රේණිය | |
|---|---|---|---|---|---|

අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. ඔබගේ සුදුසුකම් අනුව ඔබ විසින් හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් සඳහන් කරන්න.

| | |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09-557

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි), (දෙමළ/ඉංග්‍රීසි) හා (සිංහල/දෙමළ) තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2019

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකේය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) - තනතුරු 02
භාෂා පරිවර්තක (දෙමළ/ඉංග්‍රීසි) - තනතුරු 04
භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) - තනතුරු 07

02. මාසික වැටුප් පරිමාණය : රු. 36585 - 10 x 660 - 11 x 755 - 15 x 930 - රු. 65440 (MN-6-2016)- (A)

03. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි.

04. බඳවා ගැනීමේ අනුපාතය :

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 75% |
| සීමිත | 25% |
| කුසලතා | අදාළ නොවේ |

*සටහන.*-සීමිත ධාරාව යටතේ බඳවාගැනීම සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව විවෘත ධාරාව යටතේ පුරවනු ලැබේ. එසේ විවෘත ධාරාව යටතේ ද බඳවාගැනීම සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් පහත දක්වෙන සුදුසුකම් අනුව බඳවාගනු ලැබේ.

05. සුදුසුකම් : II ශ්‍රේණියේ භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි), (දෙමළ/ඉංග්‍රීසි) හා (සිංහල/දෙමළ) තනතුරු (සීමිත/විවෘත) සඳහා පහත සඳහන් සුදුසුකම් අදළ වේ.

5.1 භාෂා පරිවර්තක (දෙමළ/සිංහල) :

(I) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම,

සහ

(II) අ.පො.ස. (සා/පෙළ) හෝ ඊට සමාන විභාග යකදී සිංහල හා දෙමළ භාෂාවට හර විෂයයක් සේ පෙනී සිට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ අනෙක් භාෂාව පිළිබඳ දෙවන බස මට්ටමේ සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ පිළිගත හැකි ඊට උසස් සුදුසුකමක් සමග පළමු වැනි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබාතිබීම.

සහ

(III) සිංහල/දෙමළ භාෂා දෙකෙන් පරිගණක වදන් සැකසීමේ හැකියාව පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් විය යුතුය.

භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි)

(I) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම

සහ

(II) අ.පො.ස.(සා/පෙළ) හෝ ඊට සමාන විභාගයකදී සිංහල භාෂාවට සම්මාන සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම

සහ

(III) සිංහල/ඉංග්‍රීසි භාෂා දෙකෙන් පරිගණක වදන් සැකසීමේ හැකියාව පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත්විය යුතුය.

භාෂා පරිවර්තක (දෙමළ/ඉංග්‍රීසි)

(I) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම,

සහ

(II) අ.පො.ස. (සා/පෙළ) හෝ ඊට සමාන විභාගයකදී දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම,

(III) දෙමළ/ඉංග්‍රීසි භාෂා දෙකෙන් පරිගණක වදන් සැකසීමේ හැකියාව පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත්විය යුතුය.

5.2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවෙහි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

5.3 වෙනත් :

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
3. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

5.4 දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් ස්ථිර පත්වීම් දරන එම පත්වීම් ස්ථිර කරනු ලැබ සිටින නිලධාරින් විය යුතුය.

06. සේවා කොන්දේසි :

(i) පත්කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් විසින් නිශ්චය

කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ පිරවීමට රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

(ii) තනතුරට පත් වී වසර තුන (03) ක් ගතවීමට පෙර පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

(iii) පත්වීම ලැබ වසර පහ (05) ක් ගතවීමට පෙර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 පරිදි භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

(iv) තෝරා ගන්නා අයදුම්කරුවන් පත් කිරීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1586/30 හා 2009.02.20 දිනැති අති විශෙෂ *ගැසට්* පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අදළව තනතුරේ II ශ්‍රේණියට බඳවා ගැනේ.

(v) සියලු ම බඳවා ගැනීම්, අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියට හා ඉදිරියේ දී එම බඳවා ගැනීමේ පරිපාටියට කරනු ලබන සංශෝධනයන්ට යටත් වේ.

(vi) රාජ්‍ය සේවයේ යෙදී සිටින නිලධාරීන් සිය අයදුම්පත් අදළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

05. වයස් සීමාව :

විවෘත : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතුය.

සීමිත : අදළ නොවේ.

06. බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කෙරේ.

8.1 විභාගයේ විෂයයන් :

| | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | 1. පරිවර්තනය - සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 2. පරිවර්තනය - ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 3. සිංහල භාෂාව | පැය 1 1/2 | 100 | 40% |
| | 4. ඉංග්‍රීසි භාෂාව | පැය 1 1/2 | 100 | 40% |
| භාෂා පරිවර්තක (ඉංග්‍රීසි/දෙමළ) | 1. පරිවර්තනය - දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 2. පරිවර්තනය - ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 3. දෙමළ භාෂාව | පැය 1 1/2 | 100 | 40% |
| | 4. ඉංග්‍රීසි භාෂාව | පැය 1 1/2 | 100 | 40% |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 1. පරිවර්තනය - සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 2. පරිවර්තනය - දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 3. සිංහල භාෂාව | පැය 1 1/2 | 100 | 40% |
| | 4. දෙමළ භාෂාව | පැය 1 1/2 | 100 | 40% |

8.2 විෂය නිර්දේශය :

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | 1. පරිවර්තනය - ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට | ● පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරාගත් ඡේද 03ක් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය |

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| | 2. පරිවර්තනය - සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | ● පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරාගත් ඡේද 03ක් සිංහල භාෂා මාධ්‍යයෙන් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම |
| | 3. සිංහල භාෂාව | ● රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථය නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාක් සම්ප්‍රදයන් තේරුම් කිරීම, අක්ෂර වින්‍යාසය |
| | 4. ඉංග්‍රීසි භාෂාව | ● රචනයක් ලිවීම, දෙන ලද වචන යොදා ඒවායේ අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය තැනීම, වාක් සම්ප්‍රදයන් තේරුම් කිරීම, සංයුක්ත හා සංකීර්ණ වාක්‍ය ඛණ්ඩ විග්‍රහ කිරීම |
| භාෂා පරිවර්තක (දෙමළ/ඉංග්‍රීසි) | 1. පරිවර්තනය - දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | ● පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරාගත් ඡේද 03ක් දෙමළ භාෂා මාධ්‍යයෙන් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයට පරිවර්තනය |
| | 2. පරිවර්තනය - ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට | ● පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරාගත් ඡේද 03ක් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් දෙමළ භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම |
| | 3. දෙමළ භාෂාව | ● රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථය නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාක් සම්ප්‍රදයන් තේරුම් කිරීම, අක්ෂර වින්‍යාසය |
| | 4. ඉංග්‍රීසි භාෂාව | ● රචනයක් ලිවීම, දෙන ලද වචන යොදා ඒවායේ අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය තැනීම, වාක් සම්ප්‍රදයන් තේරුම් කිරීම, සංයුක්ත හා සංකීර්ණ වාක්‍ය ඛණ්ඩ විග්‍රහ කිරීම |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 1. පරිවර්තනය - දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට | ● පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරාගත් ඡේද 03ක් දෙමළ භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය |
| | 2. පරිවර්තනය - සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට | ● පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරාගත් ඡේද 03ක් සිංහල භාෂා මාධ්‍යයෙන් දෙමළ භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම |
| | 3. සිංහල භාෂාව | ● රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචන වල අර්ථය නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාක් සම්ප්‍රදයන් තේරුම් කිරීම, අක්ෂර වින්‍යාසය |

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| | 4. දෙමළ භාෂාව | ● රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචන වල අර්ථය නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාක් සම්ප්‍රදයන් තේරුම් කිරීම, අක්ෂර වින්‍යාසය |

09. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්* : අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කළ හැකිය. සෑම අයදුම්කරුවකුටම රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

11. විභාග ගාස්තු : විභාග ගාස්තුව රු. 1,000 කි. මෙම මුදල භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 2003-99-00 යටතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන ලදුපත අයදුම්පතේ අදළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (එහි ඡායා පිටපතක් තමන් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) කිසිම හේතුවක් නිසාවත් විභාගය සඳහා ගෙවන ලද මුදල ආපසු ගෙවනු නොලැබේ.

12. ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදිව තොරතුරු සැපයිය යුතුය. මෙම බඳවා ගැනීමේ පරීක්ෂණයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ පැවැත්වෙද්දී හෝ පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන තොරතුරු ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට හැකිය.

13. අයදුම්පත්‍ර A4 (සෙ.මී.24 x 29) ප්‍රමාණයේ කඩදසි භාවිත කරමින්,

(අ) අංක 1 සිට 3.4 තෙක් ඡේදයන් පළමු පිටුවට ද,
(ආ) අංක 4 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙළ කර ගත යුතුය.
(ඇ) අයදුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් නම සිංහල භාෂාවෙන් යුතු අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද, දෙමළ භාෂාවෙන් යුතු අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද සඳහන් කළ යුතුය. අදළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය.

13.1 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) හා (සිංහල/දෙමළ) තනතුර සඳහා බඳවා ගැනීම - 2019'' යන්න සඳහන් කරන්න.

13.2 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2019.10.11 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත දක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
341/7, කෝට්ටේ පාර, රාජගිරිය

13.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සහතික කර තිබිය යුතුය.

13.4 දනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

14. අපේක්ෂකයාගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

15. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ප්‍රින්ස් සේනාධීර,
රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් (වැ.බ.).

2019 සැප්තැම්බර් මස 20 වැනි දින,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
341/7, කෝට්ටේ පාර, රාජගිරිය.

ආදර්ශ අයදුම්පත්‍රය

භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි)/(දෙමළ/ඉංග්‍රීසි)/(සිංහල/දෙමළ) තනතුර සඳහා අයදුම්පත්‍රය
Application for the Post of Translator (Sinhala/English)/(Tamil/English)/(Sinhala/Tamil)

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

[ ]

අයදුම්කරන තනතුර : [ ]
(අදාළ අංකය සඳහන් කරන්න.)

01. භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි)
02. භාෂා පරිවර්තක (දෙමළ/ඉංග්‍රීසි)
03. භාෂා පරිවර්තක (සිංහල/දෙමළ)

1. නම :
   1.1 මුලකුරු සමඟ නම : Mr./Mrs./Miss. :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   1.2 සම්පූර්ණ නම :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   1.3 සම්පූර්ණ නම :————.
   (සිංහලෙන්/දෙමළෙන්)

   1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

2. ලිපිනය :
   2.1 ස්ථිර ලිපිනය :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   2.2 රාජකාරි ලිපිනය :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   2.3 රාජකාරි ලිපිනය :————.
   (සිංහලෙන්/දෙමළෙන්)
   2.4 ප්‍රවේශපත් එවිය යුතු ලිපිනය :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   2.5 දුරකථන අංකය :————.
   2.6 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
   2.7 පදිංචිව සිටින කාල සීමාව :————.
   2.8 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

3. 3.1 ස්ත්‍රී පුරුෂ භාවය :- ස්ත්‍රී - 1 පුරුෂ - 0 [ ] (අදළ අංකය ලියන්න)

   3.2 විවාහක/අවිවාහක බව : විවාහක - 1 අවිවාහක - 2 [ ] (අදළ අංකය ලියන්න)

   3.3 උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

   3.4 2019.10.11 දිනට වයස : අවුරුදු | | | මාස | | | දින | | |

4. අධ්‍යාපන සුදුසුකම් :
   4.1 (a) උපාධිය :————.
   (b) උපාධිය ලබාගත් වර්ෂය හා විශ්වවිද්‍යාලය :————.
   (c) උපාධියට හැදෑරූ විෂයයන් :————.

4.2 අ.පො.ස. (උ.පෙළ)
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :

| *විෂයයන්* | *සාමාර්ථ්‍යය* |
|---|---|
| | |
| | |
| | |
| | |

4.3 අ.පො.ස. (සා.පෙළ)
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :

| *විෂයය* | *සාමාර්ථ්‍යය* | *විෂයය* | *සාමාර්ථ්‍යය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

5. ඔබ කවරදක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

ඔව් නම් ඒ පිළිබඳ තොරතුරු :————.

6. විභාග ගාස්තු :
(i) විභාග ගාස්තුව ගෙවන ලද කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න) |
|---|

7. අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙම බඳවා ගැනීමේ පරීක්ෂණයේ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් පරීක්ෂණය පැවැත්වීමට පෙර හෝ එය පැවැත්වෙද්දී හෝ ඉන්පසු හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*අත්සන සහතික කිරීම*

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති .................................. නමැති අය මා පෞද්ගලිකව හොඳින් දන්නා හඳුනන බවත් ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

නම :————.
තනතුර :————.
නිල මුද්‍රාව :————.

(දැනට රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා)

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .............................මයා/මිය/මෙනවිය ............... දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත් ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත් ඉහත සඳහන් තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකවම පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් 2019 ......... මස ......... දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි. තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් මුදා හැරිය හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

නම :————.
තනතුර :————.
නිල මුද්‍රාව :————.

09-796

---

## සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2019 නොවැම්බර් මස ආරම්භ කොට පේරාදෙණියේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේදී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා 2019 ඔක්තෝබර් මස 14 වැනි දිනට ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ පළමු ශ්‍රේණියට උසස් වී ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග පිළිබඳ විස්තරය - ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවේ 08 ඡේදයේ විධිවිධාන අනුව එහි පස්වන පරිශිෂ්ඨයෙහි සඳහන් ආකාරයට විභාගය පිළිබඳ විස්තරය පහත දැක්වේ.

*විභාගය පිළිබඳ විස්තර :*

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | සමත් ලකුණු |
|---|---|---|---|
| කළමනාකරණය | පැය 03 | 100 | 40 |

03. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| කළමනාකරණය | 01 කළමනාකරණ මූලධර්ම<br>02 කළමනාකරණ ශ්‍රිතයන්<br>03 කළමනාකරණ පරිසරය<br>04 සහභාගිත්ව කළමනාකරණය<br>05 මහජන සම්බන්ධතා<br>06 යහ පාලනය<br>07 ආචාර ධර්ම |

සාමාර්ථය සඳහා ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40% ක් ලබාගත යුතු ය.

පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

''දෙපාර්තමේන්තුගත විභාගවලට (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව) මාධ්‍යය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළුවීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍යය හෝ රාජ්‍ය භාෂාවයි. තරග විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට බැඳීමට සුදුසුකම්ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාව ය.''

05. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පේරාදෙණිය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

06. අපේක්ෂකයන් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් පසුව හෙළිවුවහොත්, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

07. ඉල්ලුම්පත්‍ර අමුණා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කොට ඉදිරිපත් කළ යුතු ය. එම කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කළ යුතු ය. ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද, වන ලෙස ගෙන සකස් කළ යුතු වේ. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු වේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හෝ අසම්පූර්ණ හෝ අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

08. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව විභාගය පවත්වනු ලබන බලධාරියා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වන බැවින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාග සඳහා අදාළ වන සියළුම නීති රීති මෙම විභාගය සඳහා ද ක්‍රියාත්මක වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

09. ඉල්ලුම්පත්‍ර 2019 ඔක්තෝබර් මස 14 දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. :

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 13,
ගැටඹේ, පේරාදෙණිය.

10. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එම දිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය අයදුම්කරුගේ අත්සන හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණු අපේක්‍ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට අයදුම්කරුගේ නම හා ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ෆැක්ස් අංකය හෝ ඊමේල් ලිපිනය සඳහන් කර ඒ පිළිබඳව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත වහාම දන්වා සිටිය යුතුය. එහිදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ පිටපත හා විභාග ගාස්තු ගෙවීම අදාළ නම් එම ලදුපතෙහි පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

11. ඉහත 10 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්‍ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

12. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග අපේක්‍ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ පමණකි. අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතු ය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර, විභාග දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්‍ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

13. මෙම විභාගය ප්‍රථම වතාවට පැවැත්වෙන බැවින් ප්‍රථම වතාවට පෙනී සිටින අපේක්‍ෂකයන්ගෙන් විභාගය සඳහා ගාස්තු අය නොකිරීමට තීරණය කර ඇත.

14. අපේක්‍ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

15. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන් හි භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇත්නම් එවැනි විටක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

වෛද්‍ය කේ. ඩී. ආරියපාල,
අධ්‍යක්ෂ ජනරාල්,
සත්ත්ව නිෂ්පාදන හා
සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් දෙපාර්තමේන්තුව.

2019 අගෝස්තු මස 29 වැනි දින,
තැ. පෙ. 13,
ගැටඹේ, පේරාදෙණිය.

**ආදර්ශ අයදුම්පත**

***රාජ්‍ය පරිපාලන, ආපද කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය***

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019**
THE THIRD EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN THE SRI LANKA ANIMAL PRODUCTION AND HEALTH SERVICE– 2019

(විභාගයේ නම ලිපි කවරයේ වමත්පස ඉහළ කෙළවරේ දැක්විය යුතු ය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා. : GUNAWARDHANA, H. M. S. K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ලිපිනය (ප්‍රවේශපත්‍ර එවීම සඳහා) : ————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

03. ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. දුරකථන අංකය :

06. උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

07. පදවි නාමය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

සේවා ස්ථානය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

08. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ I ශ්‍රේණියට පත්වූ දිනය :————.

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

.................................................... මගින්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

————,
*ආයතන ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

දිනය :————.

(*අත්සන සහතික කිරීම - අයදුම්කරු අනුයුක්ත අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/නගර සභාවේ/අංශයේ/ප්‍රධානියකු විසින් සහතික කල යුතුය)

09-625

**සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිළධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2019 සැප්තැම්බර්

2014.10.11 වැනි දින හා අංක 1883/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිළධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර, දන්ත ශල්‍ය වෛද්‍ය නිළධාරීන් ස්ථිර කිරීමට පෙර හා පූර්වයෙහි මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරක නිලධාරියකු එකී පත්වීම් දින සිට දෙවසරක කාලයක් ඇතුළත සමත් විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය 2019.10.20 වැනි දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාලසටහන ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. *සුදුසුකම්* :

අදාළ විභාගය සම්පූර්ණ කර නොමැති, ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිධාරීන්ට සහ පත්වීම ස්ථිර නොකරන ලද දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ට මෙම විභාගයට අයදුම් කළ හැක. තව ද, පූර්වයෙහි මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය නිලධාරීන් පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරකට පත්කර ඇත්නම් එම නිලධාරීන්ට ද මෙම විභාගයට අයදුම් කළ හැක.

03. *අයදුම්පත්* :

මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා වෙත 2019.09.24 වැනි දින හෝ ඊට ප්‍රථම භාර දිය යුතු ය. සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ බවට ආයතන ප්‍රධානීන් විසින් සහතික කරන ලද අයදුම්පත් කොළඹ 10, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ''සුවසිරිපාය'' අධ්‍යක්‍ෂ (විභාග) වෙත 2019.09.30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. සෑම අයදුම්පත්‍රයක ම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය. තම අයදුම්පත සමඟ රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු. 45 ක් වටිනා මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවර 2ක් ද එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ හෝ වැරදි සහිතවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැ. යු* **: ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය A4 වර්ගයේ කඩදාසියක පළමු පිටුවේ අංක 1 සිට 4 (ඉ) දක්වාත් දෙවන පිටුවේ අංක 4 (ඊ) සිට අංක 9 දක්වාත් සකස් කළ යුතු ය. ඉහත ආකෘතියට අනුකූල නොවන සහ අසම්පූර්ණ සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

04. *විභාග ගාස්තු* :

(i) විභාගයට පළමුවන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25 බැගින් අවලංගු නොකළ මුද්දර අයදුම්පත්‍රයේ අලවා තමන්ගේ අත්සන සහ දිනය යොදා ඒවා නිසිලෙස අවලංගු කළ යුතු ය.

(ii) කිසිඳු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. *විභාගයට ඇතුළත් කර ගැනීම* :

(i) පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයින්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ii) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

(*අ*) ජාතික හැඳුනුම්පත;
(*ආ*) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත;
(*ඇ*) වලංගු රියදුරු බලපත්‍රය;
(*ඈ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(iii) කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරීක්ෂාකර මධ්‍යස්ථානය සහ විභාග අංකය සොයාගත හැකි ය. එසේ ඔබේ නමට අදාළ විභාග අංකය හා විභාග මධ්‍යස්ථානය සොයා ගත්තේ නම් ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිළධාරියා වෙතින් අත්සන සහතික කරන ලද ලිපියක් ද සමග වෙබ් අඩවියේ සඳහන්ව තිබූ විභාග මධ්‍යස්ථානයට පැමිණ ඔබේ අනන්‍යතාවය තහවුරු කර විභාගයට පෙනී සිටිය හැකි ය. ප්‍රවේශ පත්‍ර ලැබුණු අයදුම්කරුවන් අත්සන සහතික කර රැගෙන පැමිණිය යුතු ය. අත්සන සහතික කරන ලද ලිපිය හෝ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(වෙබ් අඩවිය-www. health. gov.lk)

06. *විභාග පරිපාටිය* :

මෙම විභාගය ලිඛිත රචනා ප්‍රශ්න පත්‍ර තුනක් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයක් වශයෙන් කොටස් හතරකින් සමන්විත ය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත් වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50 ක් ලබා ගත යුතු ය. එක් වරකදී හෝ කිහිපවරක දී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකි ය. නිළධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ දී අදාළ සියලුම විෂයන්ට පෙනී සිටිය යුතු ය.

07. *විභාග විෂය නිර්දේශ මාලාව* :

07:1 ලිඛිත විභාගය ඃ

07:1:1 ආයතන සංග්‍රහය - ප්‍රශ්න පත්‍රය
කාලය පැය 02 යි. ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය.

*විෂය නිර්දේශය* :

(i) සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පොදු රෙගුලාසි,

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති හා රෙගුලාසි,

(iii) ආයතන සංග්‍රහය ඃ

I කොටස — VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XXIII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXI, XXXII පරිච්ඡේදයන්,

II කොටස — XLVII සහ XLVIII යන පරිච්ඡේදයන්.

07:1:2 *රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය ප්‍රශ්න පත්‍රය* ඃ කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

*විෂයය නිර්දේශය* :
සෞඛ්‍ය සේවා සංග්‍රහය -

(i) රෝහල් හා මහජන සෞඛ්‍ය පරිපාලනය
(ii) රසායනාගාර සේවා කළමණාකරනය
(iii) ඖෂධ කළමණාකරනය

07:1:3 ගිණුම් ප්‍රශ්න පත්‍රය :
කාලය පැය 02 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

*විෂයය නිර්දේශය* ඃ

(i) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තොග කළමනාකරණය හා ගිණුම්කරණ රෙගුලාසි;
(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලැබූ කළමනාකරණ අත් පොතෙහි මූල්‍ය කොටස;
(iii) වෛද්‍ය නිලධාරීන් සඳහා දෛනික පරිපාලන රාජකාරි සඳහා අදාළවන රාජ්‍ය මූල්‍ය රෙගුලාසි.

| | | |
|---|---|---|
| පරිච්ඡේද I | - | මු. රෙ. 1, 2, 78 |
| පරිච්ඡේද II | - | මු. රෙ 90, 91, 101, 102, 103, 104, 105, 106, 107, 108, 109, 110, 113, 115, 118, 119 |
| පරිච්ඡේද III | - | මු. රෙ 124, 125, 126, 127, 128, 131, 133, 134, 135, 136, 137, 138, 139, 140, 142, 143, 151, 152, 154, 155, 156, 189 |
| පරිච්ඡේද V | - | මු. රෙ 200, 201, 215, 225, 238, 245, 255, 257, 260 |
| පරිච්ඡේද VI | - | මු. රෙ 380, 381, 382, 383, 384, 385, 386, 388, 389, 390, 391, 392, 393, 394 |
| පරිච්ඡේද VII | - | මු. රෙ 488, 493 |
| පරිච්ඡේද XIII | - | මු. රෙ 715, 716, 756, 757, 758 |

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

1 වැනි පරිච්ඡේදය - සියලුම වගන්ති.
2 වැනි පරිච්ඡේදය - 2.3, 2.4, 2.5, 2.6, 2.7, 2.8
3 වැනි පරිච්ඡේදය - 3.1, 3.2, 3.3, 3.4, 3.5, 3.6, 3.7, 3.8, 3.9

07:2 සිංහල/දෙමළ වාචික පරීක්ෂණය :

සිංහල/දෙමළ භාෂා ප්‍රවීනතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙන යාමේ දී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහල මාධ්‍ය නිලධාරීන්ට දෙමළ මාධ්‍යයෙන් ද, දෙමළ මාධ්‍ය නිලධාරීන්ට සිංහල මාධ්‍යයෙන් ද සන්නිවේදනය කිරීමට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ. කාලය විනාඩි 10කි.

08. *විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම* ඃ

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොළයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීම ද නොකළ යුතු ය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන් ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකතන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයෙහි නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න.

මෙම තොරතුරු www.health. gov.lk වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත.

*සැ. යු.*- මෙම චක්‍රලේඛයේ සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයන් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.

ගීතාමනී සී. කරුණාරත්න,
ලේකම් *(වැ.බ.)*,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2019 සැප්තැම්බර් මස 10 වැනි දින,
''සුවසිරිපාය''
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ දී ය.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත

**ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2019 සැප්තැම්බර්**

01 (අ) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(iii) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.

(iv) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(ආ) (i) නිල නාමය (අදාළ කොටුව තුළ ( ✓ ) ලකුණ යොදන්න.

I වෛද්‍ය නිලධාරි : II දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි :

(ii) සීමාවාසික පත්වීම ලද දිනය :————.

(iii) ප්‍රාථමික ශ්‍රේණියට / II ශ්‍රේණියට පත්වීම ලද දිනය :————.

02. ඔබ මෙවර විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයන් ඉදිරියේ ඇති කොටුව තුළ (✓) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය
ආයතන සංග්‍රහය :
ගිණුම් :
සිංහල වාචික :
දෙමළ වාචික :

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදාළ කොටුවේ (✓) හරි ලකුණ යොදන්න.) :

සිංහල : ඉංග්‍රීසි : දෙමළ :

04. (අ) (i) දැනට සේවය කරන ආයතනය (පැහැදිලිව සඳහන් කරන්න.) :————.

(ii) මෙම ආයතනය අයත් වන්නේ -

රේඛීය අමාත්‍යාංශයට :

පළාත් සභාවට :

(ආ) (i) පළාත් සභාවට නම් අදාළ පළාත :————.
(ii) එය අයත් දිස්ත්‍රික්කය :————.

(ඇ) ජංගම දුරකතන අංකය : | | | | | | | | | | |

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

(ඉ) පහත දක්වා ඇති මධ්‍යස්ථාන අතුරින් විභාගයට පෙනී සිටීමට කැමැති විභාග මධ්‍යස්ථානයට අදාළ කොටුවේ (✓) හරි ලකුණ යොදන්න. (දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් හෝ දක්වා ඇති මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් අවලංගු කරනු ලබන අතර එකී මධ්‍යස්ථානයට අයදුම් කරනු ලැබූ අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයකට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරනු ලබන වෙනත් විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | | කඳාන | | හම්බන්තොට | | අම්පාර | |
| කළුතර | | ගාල්ල | | බදුල්ල | | වව්නියාව | |
| කුරුණෑගල | | අනුරාධපුර | | රත්නපුර | | පොළොන්නරුව | |
| මහනුවර | | මඩකලපුව | | යාපනය | | ත්‍රිකුණාමලය | |

(ඊ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ රුපියල් 45.00 ක මුද්දර ඇලවූ ලියුම් කවර 02ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේ ද? :————.

(උ) (i) තැපැල් ලිපිනය (සිංහලෙන්) :————.

(ii) තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද ? :————.
(ආ) විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් මුද්දර අලවා තිබේ ද? :————.

මුද්දර කොටුව (මුද්දර අලවා ඒ මත අත්සන තබන්න.)

06. *අයදුම්කරුගේ සහතිකය* :

මගේ දැනුම හා විශ්වාසය පරිදි —

(i) මෙම අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් ප්‍රථම වතාවට නොවන බැවින් රු.... ක් වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියාකිරීමටත් මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මාගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟවන බවත් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

07. *පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ/නිලධාරිණියගේ සහතිකය :*

මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

—————,
නම සහ අත්සන.

දිනය :—————.

08. *ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

.......................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු වන අතර, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට වන/නොවන බවට ද රු.................. ක් වටිනා මුද්දර මෙම මුද්දර අයදුම්පත්‍රයට අලවා ඇති බව ද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවට ද මා ඉදිරිපිටදී අත්සන් කළ බව ද සහතික කරමි.

—————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය)

දිනය :—————.

09. *විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය :*

.......................... මහතා/මහත්මිය/මෙනවිය වෛද්‍ය නිලධාරියකු/ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

—————,
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය).

දිනය :—————.

(අනවශ්‍ය කොටස් කපා හරින්න)

09-828

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය (ඉංග්‍රීසි විෂය සහිතව) සහ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් ගුරුවරුන් විශ්ව විද්‍යාලවලට ඇතුළත් කිරීම - 2018 / 2019 අධ්‍යයන වර්ෂය**

2018/2019 අධ්‍යයන වර්ෂ තුළ පහත සඳහන් පාඨමාලා හැදෑරීම පිණිස ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සඳහා සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය (ඉංග්‍රීසි විෂය සහිතව) සහ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් රජයේ හෝ රජය අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල සේවය කරන ගුරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

I. ඉංග්‍රීසි විෂය සහිත කලා උපාධි පාඨමාලාව
II. විද්‍යාවේදී උපාධි පාඨමාලාව

02. ඉල්ලුම්කරුවන් මේ සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුයි.

I. කලා පාඨමාලාව සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන ගුරුවරුන් 2014 වර්ෂයේ හෝ ඊට පසු වර්ෂයකදී පැවැත්වූ සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය (ඉංග්‍රීසි විෂය සහිතව) සමත්ව තිබිය යුතුය;

II. ජෛවීය විද්‍යා , භෞතික විද්‍යා හෝ ව්‍යවහාරික විද්‍යා යන පාඨමාලා සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන ගුරුවරුන් 2014 වර්ෂයේ හෝ ඊට පසු පැවැත්වූ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත්ව තිබිය යුතුය;

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ගුරුවරයෙකු වශයෙන් අවුරුදු 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය. අදාළ ගුරු පත්වීම ස්ථිර කර තිබිය යුතුය;

IV. දැනටමත් ගුරු අභ්‍යාස විද්‍යාලයක, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක, විශ්වවිද්‍යාලයක හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ පාඨමාලා හැදෑරීම සඳහා ලියාපදිංචි වී නොසිටිය යුතුය;

V. යම් විශ්වවිද්‍යාලයක පවත්නා ජෛවීය විද්‍යා , භෞතීය විද්‍යා හෝ ව්‍යවහාරික විද්‍යා පාඨමාලාවක් සම්බන්ධයෙන් වූ විට , අදාළ පාඨමාලාවට සුදුසුකම් ලැබීම පිණිස අ.පො.ස. (උසස් පෙළ ) විභාගයේදී හෝ විද්‍යාවේදී (බාහිර ) උපාධි පළමු පරීක්ෂණයේදී හෝ අදාළ විශ්ව විද්‍යාලය විසින් පූර්ව අවශ්‍යතාවක් ලෙස දක්වනු ලබන විෂයයන් සඳහා සාමාර්ථ ලබා තිබිය යුතුය;

VI. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔවුනට අධ්‍යයන නිවාඩු ලබා දිය යුතු බැවින් එසේ අධ්‍යයන නිවාඩු හිමිකම් ඇති ගුරුවරුන් පමණක් මේ සඳහා අයදුම් කළ යුතුය.

03. මෙම ප්‍රවේශය යටතේ සිසුන් තෝරා ගනු ලබනුයේ සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණයේදී (ඉංග්‍රීසි විෂය සහිතව) හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණයේදී ලබා ගත් මුළු ලකුණු අදාළ විෂයට ලබාගත් ලකුණු සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පවත්වන සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු පදනම් කරගෙනය.

04. වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට ඇති හිමිකම් පිළිබඳ සම්මුඛ පරීක්ෂණයේදී විමසා බලනු ලැබේ.

05. උපාධි ලබා ගැනීමෙන් අනතුරුව උපාධි ගුරු පත්වීම් ලබාදීම පිළිබඳ වගකීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

06. රජය අනුමත කරන පෞද්ගලික පාසල්වල සේවය කරන ගුරුවරුන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත්වල එම පාසලේ විදුහල්පති / කළමනාකරු විසින් අදාළ ගුරුවරිය / ගුරුවරයා සඳහා අධ්‍යයන නිවාඩු අනුමත කළ හැකි / නොහැකි බව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

07. රජයේ ගුරුවරුන්ගේ අයදුම්පත් විදුහල්පති , කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින්ද , රජය අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ගේ අයදුම්පත් අදාළ විදුහල්පති / කළමනාකරු විසින්ද සහතික කළ යුතුය.

08. සෑම අයදුම්පතක් ම මෙහි සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට පිටපත් දෙකකින් (02) යුතුව 2019.10.21 දිනට පෙර ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය,"ඉසුරුපාය, බත්තරමුල්ල ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීම සඳහා අයදුම්පත් 2018 / 2019 (ගුරුභවතුන් සඳහා) " යනුවෙන් සඳහන් කළ යුතුය.

එම්.එන්. රණසිංහ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

***අධ්‍යාපන අමාත්‍යාංශය***

*සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය (ඉංග්‍රීසි විෂය සහිතව) හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් ගුරුවරුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම*
*2018/2019 අධ්‍යයන වර්ෂය*

1. (i) මුලකුරු සමග නම :————.
   (ii) සම්පූර්ණ නම :————.

2. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

3. (i) තනතුර :————. (ii) ශ්‍රේණිය :————.

4. ලිපිනය
   (i) රාජකාරි :————.
   (ii) පෞද්ගලික :————.

5. දුරකතන අංකය (i) ස්ථාවර :————. (ii) ජංගම :————.

6. විද්‍යුත් ලිපිනය (E-mail) :————.

7. වර්තමාන සේවා ස්ථානය
   (i) පාසල :————.
   (ii) කලාපය :————.
   (iii) දිස්ත්‍රික්කය :————.
   (vi) පළාත :————.

8 (i) මුල් පත්වීම් දිනය :————.
   (ii) ස්ථිරත්වය ලද දිනය :————.
   (iii) සේවා කාලය (මුල් පත්වීමේ සිට අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
   වර්ෂ :————. මාස :————. දින :————.

9. ගුරුවරයෙකු වශයෙන් ලියාපදිංචි අංකය :————.

10 (i) උපන් දිනය
   වර්ෂය :————. මාසය :————. දිනය :————.

(ii) වයස (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
   වර්ෂ :————. මාස :————. දින :————.

11. සුදුසුකම් ලබන විභාගය පිළිබඳ විස්තර (විශ්වවිද්‍යාලය මගින් නිකුත් කරන ලද අදාළ ප්‍රතිඵල ලේඛනයේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුයි.
   (i) විභාගය :————.
   (ii) විශ්වවිද්‍යාලය :————.
   (iii) ප්‍රතිඵල :————.

| | විෂයය | සමත්වූ වර්ෂය | ලකුණු | ශ්‍රේණිය |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |
| 5. | | | | |

12. හැදෑරීමට අපේක්ෂිත උපාධි පාඨමාලාව සහ විෂයයන් ඃ
   (i) උපාධි පාඨමාලාවේ නම :————.
   (ii) විෂයයන් (1) ————————.
   (2) ————————.
   (3) ————————.

13. මෙම ප්‍රවේශය යටතේ ඔබව තෝරා ගතහොත් ඇතුළත්වීමට අපේක්ෂා කරන විශ්වවිද්‍යාලවල නම් ඔබගේ කැමැත්තේ අනුපිළිවෙලට සඳහන් කරන්න.
   (1) ————————. (3) ————————.
   (2) ————————. (4) ————————.

14. ඔබ ගුරු අභ්‍යාස විද්‍යාලයක/අධ්‍යාපන පීඨයක/විශ්වවිද්‍යාලයක හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ වෙනත් පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටීද?

එසේ ලියාපදිංචි වී ඇත්නම් ඒ පිළිබඳ විස්තර :
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

........................ හිමි/මයා/මිය/මෙනවිය ............ දින සිට ............ ලෙස (තනතුර/ශ්‍රේණිය) ............... විද්‍යාලයේ සේවය කරන බවත් ඔහුට/ඇයට පෙර මාසයේ වැටුප ගෙවන ලද්දේ මෙම පාසලෙන් බවත්, යතෝක්ත අධ්‍යයන පාඨමාලාව හැදෑරීම සඳහා ඔහු/ඇය නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

අයදුම්කරුට/අයදුම්කාරියට අවශ්‍ය අධ්‍යයන නිවාඩු ලබාදීම නිර්දේශ කරමි/නොකරමි. (අධ්‍යයන නිවාඩු අනුමත නොකරන්නේ නම් හේතු දක්වන්න)

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

නිර්දේශ කරමි/නොකරමි.

————,
විදුහල්පති.
(අත්සන හා නිලමුද්‍රාව).

දිනය :————.
ලිපිනය :————.

නිර්දේශ කරමි/නොකරමි.

————,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ.
(අත්සන හා නිලමුද්‍රාව)

දිනය :————.
ලිපිනය :————.

නිර්දේශ කරමි/නොකරමි.

දිනය :————.
ලිපිනය :————.

————,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ.
(අත්සන හා නිලමුද්‍රාව)

09-1001

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.